RECEIVED 16/05/2015 00:27

07 NOV 2019

**<u>මහ විලච්චිය මහා වාරි ව්‍යාපාරයේ 2019/20 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ කරන නිවේදනයයි</u>**

1994 අංක 13 දරණ වාරිමාර්ග සංශෝධන පනතේ 5 වන වගන්තියේ 5 වන අනු වගන්තියට අනුව 2019/10/08 දින මහ විලච්චිය සංස්කෘතික මධ්‍යස්ථාන රැස්වීම් ශාලාවේදී පැවති මහ විලච්චිය මහා වාරි ව්‍යාපාරයේ 2019/20 මහ කන්නය සඳහා වූ වගා තීන්දු තීරණ

| අනු අංකය | කාරණය | විස්තරය |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | වී මාස 03,3 ½ |
| 02 | වගා කරන බිම් ප්‍රමාණය | අක්කර 3100 |
| 03 | වාරි පහසුකම් සැපයීමට නියමිත ප්‍රමාණය | අක්කර 2664 |
| 04 | මූලික බිම් සැකසීම ආරම්භ කරන දිනය | 2019.10.15 |
| 05 | වැපිරීම සඳහා ජලය නිකුත් කරන දිනය | 2019.11.01 |
| 06 | වපුරා අවසන් කරන දිනය | 2019.11.10 |
| 07 | මුර ජල ක්‍රමය ආරම්භ කරන දිනය | 2019.11.20 |
| 08 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.02.10 |
| 09 | අස්වනු නෙලා අවසන් කරන දිනය | 2020.02.25 |
| 10 | ගොවි සංවිධාන සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.10.15 |
| 11 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ පවිත්‍ර නොකරනු ලබන ඇළවල් ගොවි සංවිධාන විසින් ශුද්ධ පවිත්‍ර කර අවසන් කල යුතු දිනය | 2019.10.20 |
| 12 | වගා රක්ෂණ අවසන් කළ යුතු දිනය | 2019.11.10 |
| 13 | වගා හානි දැනුම්දිය යුතු අවසන් දිනය | 2020.02.20 |

I. කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය. එම මුදල වාරි පද්ධතියේ නඩත්තුවට පමණක් උපයෝගී කර ගත යුතුය.

II. වගා කන්නයකට 3 වතාවක් ඇලවල් ශුද්ධ කල යුතුය.නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල කම් පංගු කොටස සුද්ද පවිත්‍ර නොකරන ගොවීන්ගෙන් කෙත් ඇලකට බඹයකට රු.100.00 බැගින් අපවහන ඇල බඹයකට රු.200.00 බැගින් හා බෙදුම් ඇල බඹයකට රු.200.00 බැගින් දඩ මුදලක් අය කිරීම. (ඒ පිළිබඳ අදාල කෘ.ප.නි.ස. නිලධාරීන් පරීක්ෂා කර තීරණ ලබා දිය යුතුය)

III. දිලීර හානි සහ කීඩෑ හානි පැවති ක්ෂේත්‍ර භූමි හැර අනෙකුත් කුඹුරුවල පිදුරු පිලිස්සීම වෙනුවෙන් අක්කර 01 ක පිදුරු ගොඩකට රු.1,000.00 ද අක්කරයක අතුරා ඇති විට රු.2,500.00 ක දඩ මුදලක් අය කිරීම.

IV. අයාලේ යන ගවයින්ගෙන් වනහානි සඳහා රු.1,000.00 ක දඩ මුදලක් අය කිරීම.

V. බෝගයන්ට හෝ වාරිමාර්ග පද්ධතියට / ඇලවේලි හෝ නිර්මිත වලට හානි කල අවස්ථා වලදී අදාල ආයතනයේ ඇස්තමේන්තුගත මුදල දඩයක් ලෙස ගව හිමියාගෙන් අය කිරීම.

VI. ගොවි ආරාධනයෙන් ශ්‍රම දායකත්වය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන ඕනෑම අවස්ථාවක සාමාජිකයා ශ්‍රම දායකත්වය ලබා දිය යුතුය.සාමාජිකයාගෙන් නියෝජිතයෙකු සහභාගී නොවන්නේනම් ප්‍රදේශයේ දැනට පවතින දිනක වැටුප වන රු.1,200.00 බැගින් වරුවකට රු.600.00 බැගින් වශයෙන් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

වෙනත් කරුණු- අවශ්‍යතාවය අනුව විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටුවක් පවත්වා එහි එකගතාවය මත සංශෝධනය සිදු කළ හැක.

ආර්.එම්.වන්නිනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර

**ආර්.එම්. වන්නිනායක**
**දිසාපති/ දිස්ත්‍රික් ලේකම්**
**අනුරාධපුර**

RECEIVED 16/05/2015 00:27

07 NOV 2019

**<u>මහකනදරාව මහා වාරි ව්‍යාපාරයේ 2019/20 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ කරන නිවේදනයයි</u>**

1994 අංක 13 දරණ වාරිමාර්ග සංශෝධන පනතේ 5 වන වගන්තියේ 5 වන අනු වගන්තියට අනුව 2019/10/08 දින රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පැවති මහ කනදරාව මහා වාරි ව්‍යාපාරයේ 2019/20 මහ කන්නය සඳහා වූ වගා තීන්දු තීරණ

| අනු අංකය | කාරණය | විස්තරය |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | වී මාස 03,3 ½ |
| 02 | යෝජිත වගාබිම් ප්‍රමාණය | අක්කර 6100 |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | වම් ඉවුර හා දකුණු ඉවුර ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ |
| 04 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව , ගොවි සංවිධාන සහ ගොවීන් විසින් ප්‍රධාන ඇල සහ බෙදුම් ඇලවල්, සහ කෙත් ඇලවල් සහ අපවහන ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.10.25 |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ පවිත්‍ර නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධාන විසින් ශුද්ධ කළයුතු අවසන් දිනය | 2019.10.30 |
| 06 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2019.11.01 ( නිකුත් කළ හැකි ජල ධාරිතාවයක් ලැබුණු පසු ) |
| 07 | බිම් සැකසීම ආරම්භ කළයුතු දිනය | 2019.11.01 |
| 08 | වපුරා හෝ පැළ සිටුවා අවසන් කළයුතු දිනය | 2019.11.25 |
| 09 | මුර ජල කාලය | දින 90 |
| 10 | මුර ජලය ආරම්භ වන දිනය | 2019.11.30 |
| 11 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.02.25 |
| 12 | වගා රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2019.11.25 |
| 13 | වගා හානි දැනුම්දිය යුතු අවසන් දිනය | 2020.03.25 |
| 14 | අස්වනු නෙළා අවසන් කිරීමට යොජිත දිනය | 2020.03.25 |

I. ගොවි සංවිධාන සංවර්ධන අරමුදල සඳහා අරමුදල සදහා වගා කරනු ලබන සෑම අක්කර 1 ක් සඳහාම රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

II. නියමිත දිනට ඇලවේලි ශුද්ධ නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානය විසින් අය කරනු ලැබේ.

III. වාරි නිර්මිතවලට හානි කිරීමේ දඩය - වාරිමාර්ග ආඥා පනත අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු වේ.

IV. 2019.11.01 දින සිට 2020.03.30 දක්වා කාලය තුළ යායට ගවයන් ඇතුළත් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.

වෙනත්කරුණු- අවශ්‍යතාවය අනුව විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටුවක් පවත්වා එහි එකගතාවය මත සංශෝධනය සිදු කළ හැක.

ආර්.එම්. වන්නිනායක
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර